



# මං වැඩිපුරම ආදරේ මට

## ශේශාද්‍රි ප්‍රියසාද්

**සිනමාවේ දිදුලණ තරුණ රංගන ශල්පිණියි ශේසාද්‍රි ප්‍රියසාද් කලා පරපුරක වර්තමාන පුරුකක්. රුවින් හා හැකියාවෙන් අගතැන්පත් ඇය සමගින් සන්නස රිදී සාකච්ඡා කළේ ඒ නිසයි.**

**මේ දවස්වල පදිංචිය?**
මගේ ගෙදර, නුගේගොඩ.

**ආසම නැතිදේ?**
ඕප දූප හොයන්න, සමහරු අනවශ්‍ය විදියට ඕප දූප හොයද්දි මට එපා වෙනවා.

**වැඩියෙන්ම ආදරේ?**
මට.... ඕනම කෙනෙක් මුලින්ම ආදරේ කරන්න ඕන තමන්ටයි. තමන්ට ආදරේ නොකරන කවුරුත් වෙන කෙනෙක්ට ආදරේ කරන්නේ නෑ.

**සිද්ධ වුන වැරදීම දේ?**
වැරදි දේ කියලා ආයෙත් වැරදි වැඩ කරගන්න මම කැමති නැහැ. කරපු වැරදි වැඩ ආයි නොකරන්න වග බලා ගන්නවා.

**කරපු හොඳම දේ?**
මම කැමතියි මං කරන හොඳ දේවල් හිතේම තියාගන්න.

**හිතට දුකක් දැනුනහම?**
මි............ටිකක් නිස්කලංකෙ ඉන්න කැමතියි.

**ජීවිතය ගැන හිතෙන්නේ?**
අපි බලාපොරොත්තු නොවුන දේවල් තමයි ජිවිතයේ තියෙන්නෙ, ඒ ගැන දුකක් නැතුවම නෙවෙයි. ඒත් ඒ ඇත්තට මම මුහුණ දෙනවා.

**බලාපොරොත්තු?**
කාටවත් කරදරයක් නැතුව හිතේ සැනසීමෙන්, සැහැල්ලුවෙන් ඉන්න තියෙන බලාපොරොත්තුවයි හැමදාමත් තියෙන්නෙ...

*

සඳගෝමි




**සිසිර දිසානායක**

සීත රැයවල් ගෙවෙමින් වසන්තය උදාවෙයි. මෙල්බන් නුවර ගී වසන්තය නම් ඇරඹුනේ සොබා දම් දිනිතියගේ වසන්තය ලැබීමට පෙර සිටමයි. සීත රැයවල් උණුසුම් කරමින් අපගේ කෝකිලයින් කෝකිලාවන් ගයන්නේ කා වෙනුවෙන්ද ?

"සීත රෑ වසන්තේ - කාටදෝ ගයන්නේ ?

ගීයක මුල් පදයක් සිහිවෙයි. වාද්‍ය විශාරද, ගායන නිපුන් සනත් නන්දසිරි සංගීතවේදියාණන් සහ මල්කාන්ති නන්දසිරි ගායන ශිල්පිනිය ගැයූ යුග ගීයකි ඒ. ඒ නමින් ම ඉදිරිපත් වන ගී ප්‍රසංගයක් සඳහා මෙල්බන් නුවර බර්වුඩ් ප්‍රදේශයේ "බීසන් සෙන්ටර්" වේදිකාව සූදානම් වෙයි. ඒ ඔක්තොම්බර් තුන්වෙනිදාටයි. " සීත රෑ වසන්තේ " ගී ප්‍රසංගයට සහභාගී වීමට මව්බිමේ සිට සූදානම් වන සනත් නන්දසිරි මහාචාර්වරයාවත්, මල්කාන්ති නන්දසිරි ගායන ශිල්පිනියවත්, තබ්ලා වාද්‍ය විශාරද මනෝජ් පීරිස් ශිල්පියාවත් දුරකතනයෙන් හමුවුණොමු.

"ප්‍රසංගයේදී වගේම ඊට කලිනුත් මේ වාගේ මෙල්බර්න් වාසීන්ව අමතන්න ලැබීම හරි සතුටක්. අපි බොහෝ රටවල්වල ප්‍රසංග පවත්වලා තියෙනවා. ඕස්ට්‍රේලියාවේ පවත්වපු ප්‍රසංග තමයි ඉහළින්ම සාර්ථක වුණේ. ඒ කියන්නේ අනික් රටවල ප්‍රසංග අසාර්ථක වුණා කියලා එහෙම නෙවයි. ඔහේ ඉන්න සංවිධායකවරු බොහොම උනන්දුවෙන් තමන්ගේ කටයුතු කරනවා."

දුරකථනයෙන් මේ ඇසෙන්නේ සනත් නන්දසිරි සංගීතවේදියාණන්ගේ ගැඹුරු කටහඬයි. ශ්‍රී ලංකාවේ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ අංශාධිපති තනතුර හොබවමින් සංගීත විද්‍යාර්ථීන්ගේ නැණ නුවණ අවදි කළ සනත් නන්දසිරි මහාචාර්යවරයා ඉන් විශ්‍රාම ගැනීමෙන් පසුව දැනට බාහිරව එම කටයුතු කරගෙන යයි. සංස්කෘතික අමාත්‍යංශයේ අධ්‍යක්ෂ තනතුරක් ද හෙබවූ මහාචාර්ය සනත් නන්දසිරි ශිල්පියා රසික හද දිනාගත්තේ ගැඹුරු, මයුර හඬින් කරනා සිය ගායනාවන් නිසාවෙන්. පණ්ඩිත් අමරදේවයන්ගෙන් පසුව ඒ මගෙහි යමින් ඊට තවත් නැවුම් නිර්මාණ එක් කරමින් ඉන් පසු පරපුර නියෝජනය කළ මූලිකයින් දෙදෙනාගෙන් එක් ගායන ශිල්පියෙකි, සනත් නන්දසිරි ශිල්පියාණන්.

අපි ප්‍රසංගය ඉදිරිපත් කරන පිළිවෙල වෙනස්. ඒ නිසා වෙනදා වගේ ම ජනතාව එයි මේ ප්‍රසංගය නරඹන්නට. එදාට අපි අළුත් ගීත එහෙමත් රසවත් කතාත් එක්ක ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඉතින් මේ දේවල් රසවිඳින්න රසිකයින් එදාට අපිත් එක්ක සිටීම තමා අපට තියෙන සතුට."

"ඒ වගේම සංගීතය සපයන්නේ ඉන්ද්‍රජිත් මිරිහාන. මේ රටේ හිටිය දක්ෂ කී බෝඩ් වාදකයෙක්. අපි බයේ හිටියෙ ඔහු ලංකාවෙන් යන එක ගැන. කොහේ හිටියත් ඔහු අපිත් එක්ක එකතු වෙනවා. ඔහුට අපේ ගීත කට පාඩම්. මේ ප්‍රසංගයෙදි අපට එකතු වෙන ඉන්ද්‍රජිත් පුතාටත් ලොකු සතුටක් වේවි."

**ඕස්ට්‍රේලියාව, මෙල්බන් කිව්වම අපට විශේෂත්වයක් තියෙනවා. ඒ මොකද කියලා මට එකපාරටම කියන්න අමාරුයි. මං හිතන්නේ ඒ අයගේ සුහද ප්‍රතිචාර නිසා වෙන්න ඕන. සිංහල පිරිස විතරක් නෙවෙයි. බර්ගර් අය පවා අපේ ප්‍රසංග බලන්න ආවා. ඉතින් අපි හොඳ ගීත ටිකක් වැඩි සැලකිල්ලකින් ගායනා කරන්න ඕන කියලා හිතනවා.**

වර්තමානයේ ලැබුණ තානාන්තර පවා ප්‍රතික්ෂේප කරමින් තම රසිකයින් වෙනුවෙන් ගැයීමට කැප වූ සනත් නන්දසිරි සංගීතවේදීයාණන්ට සුබ පතමින් අප ඉන් අනතුරුව යොමු වූයේ මල්කාන්ති නන්දසිරි ශිල්පිනිය වෙතටයි.

"ඕස්ට්‍රේලියාව, මෙල්බන් කිව්වම අපට විශේෂත්වයක් තියෙනවා. ඒ මොකද කියලා මට එකපාරටම කියන්න අමාරුයි. මං හිතන්නේ ඒ අයගේ සුහද ප්‍රතිචාර නිසා වෙන්න ඕන. සිංහල පිරිස විතරක් නෙවෙයි. බර්ගර් අය පවා අපේ ප්‍රසංග බලන්න ආවා. ඉතින් අපි හොඳ ගීත ටිකක්